# සිංහල බෞද්ධ චින්තනය පරාජය වීම

විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් අද අභාවයට ගොස් ඇත. ඒ පිරිවෙන් නමට පවත්වාගෙන යන බව සැබෑ ය. එහෙත් ඒ පිරිවෙන්වලට අද ගිහි සමාජයේ තබා පැවිදි සමාජයේවත් වැදගත්කමක් නො ලැබෙයි. මා එසේ සඳහන්කිරීම පිළිබඳව ඇතැමුන් උදහස් වීමට බැරි නැත. එහෙත් අද තරුණ භික්ෂුන්වහන්සේලා විශ්වවිද්‍යාලවලට ඇතුල්වීමට ගන්නා උත්සාහයෙන් දහයෙන් එකක්වත් මහා පිරිවෙනකට ඇතුල්වීමට නොගන්නා බව පැහැදිලි ය. අතීතයෙහි පිරිවෙන් අධ්‍යාපනයට ලැබුණු වටිනාකම දැන් නො ලැබෙයි.

එයට ඇත්තේ එකම එක හේතුවක් පමණකි. ඒ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අදහස් අභියෝගයට ලක් නොකරම මෙන් පිළිගැනීම නිසා සිදු වූවකි. ඇතැම් විචාරකයන් කියන්නේ අප අපේ වැරදිවලට බටහිරයන්ට දොස් නගන බව ය. අද අපේ තත්වයට වැරදිකරුවා ප්‍රධාන වශයෙන් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මිස අනෙකක් නො වේ. අප එකිනෙකාගෙන් වෙන් වී ඉන්ද්‍රිය පිනවීම පසුපස හඹායන්නේ අප බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අනුකරණය කළ හා කරන බැවිනි. අපට පමණක් නොව මුළු ලොවට ම විනයක් වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ය. මෙහි සුළු කොටසක් ලෙස ගතහොත් මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය මුළුමනින් ම මෙන් බටහිරයන් නිසා ඇති වූවකි. දහඅටවැනි සියවසෙන් පසුව මෙරටට දෙමළ කතාකරන ජනයා දකුණු ඉන්දියාවෙන් ආනයනය කර ඔවුන්ට වරප්‍රසාද දී ඔවුන් ලවා සිංගලත්වයට එරෙහිව ක්‍රියාකිරීමට කටයුතු කළෝ බටහිරයෝ ය.

පහළොස්වැනි සියවස අග දකුණු යුරෝපයේ ඇතිවූ චින්තන විප්ලවය නොවන්නට මෙලොව මෙයට වඩා යහපත් තැනක් වීමට තිබුණි යැයි මම සිතමි. අප එකිනෙකාගෙන් හා භූමියෙන් වෙන්කර හුදකලාව ජීවත්වන තනි තනි පුද්ගලයන් කෙරුණේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හේතුකොටගෙන ය. (මා චින්තනය යන වචනය යොදන්නේ හා මගේ ලෝකය කෘතියට නිකුත්වීමට ද පෙර යොදාගෙන ඇත්තේ ගුණදාස අමරසේකර මහතා ජාතික චින්තනය යන්න යොදාගන්නා ආකාරයෙන් නොවන බව විචාරාත්මක ව මේ ලිපි කියවන පාඨකයන් මේ වන විට අවබෝධ කරගෙන ඇතැයි සිතමි.) මේ චින්තන විප්ලවය නොවන්නට අපට සුඛෝපභෝගී භාණ්ඩ නැතිවන්නට තිබිණි. එහෙත් මිනිසුන්ගේ ජීවිත මෙතරම් කාලකන්නි නොවනු ඇත.

ඇතැම් විචාරකයන් නගන ප්‍රශ්නයක් නම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සිංහල බෞද්ධ චින්තනය යටවූයේ ඇයි ද යන්න ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පරාජය කිරීමට සිංහල බෞද්ධ චින්තනයට නොහැකි වී නම් ඉන් කියැවෙන්නේ සිංහල බෞද්ධ චින්තනයේ දුර්වල බව නොවේ දැයි පඬියෝ ප්‍රශ්න කරති. මේ වැදගත් ප්‍රශ්නයකි. අප එයට සුදුසු පිළිතුරක් දිය යුතු ය. මෙහි දී අපේ සිහියට නැගෙන වෙනත් කරුණු දෙකක් මෙහි දී සඳහන් කළ යුතු ය. එකක් නම් අද වන විට ලෝකයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට පරාජය වී ඇත්තේ සිංහල බෞද්ධ චින්තනය පමණක් නොවන බව ය. කතෝලික චින්තනය ද ඇතුළු අන් සියලු චින්තන ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට පරාජය වී ඇත. දෙවනුව සිංහල බෞද්ධ චින්තනය වෙනත් චින්තනයකට මෙයට කලින් පරාජය වී නොතිබුණ ද එම චින්තනයෙහි පුරෝගාමි චින්තන වෙනත් චින්තනවලට පරාජය වී ඇත.

උදාහරණ ලෙස ගතහොත් මේ කලාපයේ තිබූ අනාර්ය (ද්‍රවිඩ නොවන අර්ථයකින්) චින්තන ආර්යයන්ගේ වෛදික චින්තනයට පරාජය වී ඇත. පසුව අර්ධ වෛදික සමාජයක බුදුන් වහන්සේට වෛදික චින්තනය පරාජය කළ හැකි වුවත් සියවස් කිහිපයක ඇවෑමෙන් මහායානය වේශයෙන් වෛදික චින්තනයට දඹදිව (ථෙරවාදී) බෞද්ධ චින්තනය පරාජය කළ හැකි විය. පසුව මහායානය වෛදිකයන්ගේ හින්දු චින්තනයට මුළුමනින් ම යටවිය. ලංකාවේ සිංහල භික්ෂුන් වහන්සේ එවැනි වටාපිටාවක මෙරට සිංහල බෞද්ධ චින්තනය ආරක්ෂාකරගත්තේ අවසානයේ දී ඒ මත පදනම් ව නිර්මාණ නොකිරීමට තීරණය කිරීමෙන් ය. යම් අයුරකින් එකල සිංහල බෞද්ධ චින්තනයෙහි නිර්මාණ කිරීමට ඉඩ දුනි නම් සිංහල බෞද්ධයන් ද සිංහල හින්දූන් ලෙස කෙළවර වනු නිසැක ය.

චින්තනනයක් වෙනත් චින්තනයකට යටවන්නේ ඒ චින්තනයෙහි ඇති නෛසර්ගික දුර්වලතාවක් නිසා නොව අදාළ සමාජයට ඒ චින්තනයට වඩා වෙනත් චින්තනයක් යෝග්‍ය බැවිනි. සමාජ වෙනස්වන්නේ චින්තන නිසා ය. එසේ ම චින්තන නිසා සමාජ ද වෙනස් වෙයි. එය චක්‍රිය ආකාරයෙන් සිදුවෙයි. ආත්මයක් නැතැයි ද නිත්‍ය වූ කිසිවක් නැතැයි

© Prof. Nalin De Silva

ද යනුවෙන් ඉගැන්වෙන චින්තනයකට වඩා නිත්‍ය වූ ආත්මයක් ඇතැයි යනුවෙන් කියැවෙන චින්තනයක් පිළිගැනීමට මිනිස්සු පෙළඹෙති. මම යනුවෙන් නිත්‍ය වූ හරයක් පුද්ගලයකු සතු යැයි පිළිගැනීමට මිනිසුන්ට කැමැත්තක් ඇත. වයසට ගියත් ඇඟ රැළි වැටුණත් කෙස් පැහුණත් නොවෙනස්වන මමක් ආත්මයක් ඇතැයි ගැනීම බොහෝ අයට ප්‍රියජනක ය. එසේ නොහන්නා බුද්ධදහම මෙතරම් කලක් පැවතීම ම එක් අතකින් ආශ්චර්යයකි. එහි සියලු ගෞරවය එකල වැඩ විසූ සිංහල භික්ෂූන් වහන්සේට හිමිවිය යුතු ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තරම් පෘථග්ජන මිනිසාට ආකර්ෂණීය වෙනත් සමාජ ක්‍රමයක් ලෝකයෙහි එතෙක් මෙතෙක් බිහි වී නැත. ඉන්ද්‍රිය පිනවීම ළදරුවන්ගේ සිට මහල්ලන් දක්වා සියල්ලන්ට ම පාහේ ආකර්ෂණීය වූවකි. පැණි රස වෙනුවට කරවිල කෑමට කැමති දරුවෝ කෙතෙක් වෙත් ද? අපේ ශරීරය මෙන් ම මනස ද ඉන්ද්‍රිය පිනවීම සඳහා සකස් වී ඇත. එවැනි පසුබිමක මිනිසුන් වඩා පිළිගන්නේ ඉන්ද්‍රිය තැවීමට උපදෙස් දෙන දහමක් ද නැත්නම් ඉන්ද්‍රිය පිනවීමට දිරිදෙන දහමක් ද?

කතෝලික චින්තනය ද නිත්‍ය ආත්මයක් පිළිගත්ත ද, ඉන්ද්‍රිය පිනවීමට දිරි දීමෙන් වැළකී සිටියේ ය. මෙලොව ඇති වූ බොහෝ චින්තන ඉන්ද්‍රිය පිනවීමෙහි ඇති නිස්සාරත්වය ඉගැන්වී ය. බොහෝ මිනිසුන් ඒ පිළිගත්තේ බුද්ධියෙන් මිස හිතකින් නො වේ. ඔවුන්ගේ හිත සෑම විට ම ඇදෙන්නට ඇත්තේ ඉන්ද්‍රිය පිනවීමට ය. එහෙත් චින්තනය සමග බිහිවන සංස්කෘතික බලපෑම් හේතුවෙන් බොහෝ දෙනා තම හැඟීම් යටපත්කරගත් අතර ඇතැම්හු එසේ හැඟීම් යටපත්කිරීම ව්‍රතයක් ලෙස පුහුණු කළහ. තවුසෝ එවැන්නෝ වූහ. තවුස්, තපස් යන්නෙහි තේරුම තැවීම යන්න ය. බටහිර භෞතික විද්‍යාවෙහි ඉගෙන ගන්නා තාපයෙන් ද සිදුවන්නේ තැවීමක් බව අපි දනිමු.

අතරින් පතර ඉන්ද්‍රිය පිනවීම ගැන කතාකළ අය එකල ද සිටියහ. එහෙත් ඔවුන්ට ප්‍රධාන ධාරාව බවට පත්වීමට නො හැකි විය. එයට ප්‍රධාන හේතුවක් වන්නට ඇත්තේ සාමූහිකත්වය පරදවා පෞද්ගලිකත්වයට ඉස්මතුවීමට ඒ සමාජවල ඉඩක් නොමැතිවීම යැයි සිතිය හැකි ය. එහෙත් පහළොස්වැනි සියවසෙහි දී දකුණු යුරෝපයෙහි මතුවූයේ පෞද්ගලිකත්වය ඉස්මතු වූ වෙන්කිරීම ප්‍රධාන තැනක් ගත් චින්තනයක් විසින් බිහිකෙරුණු සමාජයක ඉන්ද්‍රිය පිනවීමකි. එවැනි සමාජයක කලින් මෙන් නොව ඉන්ද්‍රිය පිනවීමට සමාජයේ පිළිගැනීමක් ලැබිණි.

මේ වෙන්කිරීම හා ඒ සමග බැඳුණු විශ්ලේෂණය නොමැතිව බටහිර විද්‍යාව ඇතිවීමට ද ඉඩක් නො තිබිණි. ඒ සියල්ල හා පසුව ධනවාදය බිහිවීම ද එකම චින්තනයක ප්‍රතිඵල වෙයි. ඒ කෙසේ වෙතත් මධ්‍යම ප්‍රතිපදාව මත පිහිටා වුවත් ඉන්ද්‍රිය තවන චින්තනයකට වඩා මිනිස් ස්වභාවය වූ ඉන්ද්‍රිය පිනවීමට හා ඒ සමග පරිභෝජනය වර්ධනයකිරීමට දිරිදුන් චින්තනයක් ජනතාව අතරට ගෙනයෑම සාධාරණ වශයෙන් ගත්කල පහසු වෙයි. අප රටේ වුව ද ඒ එසේ වෙයි. එබැවින් සිංහල බෞද්ධ චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට පැරදීම පුදුමයක් නො වෙයි. පුදුමය ඒ පැරදවීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට මෙතරම් කාලයක් ගතවීම ය.

එයට හේතුව අන් කිසිවක් නොව අවුරුදු දෙදහසක් පමණ පැරණි සංස්කෘතියක් විසින් සිංහලයන්ට හිමිකර දෙනු ලැබූ පන්නරය ය. අප බොහෝ විට කියා ඇති පරිදි බටහිර උසස් පෙළ අධ්‍යාපනය ගමට යන තුරුම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සිංහල බෞද්ධ චින්තනය පැරදවීමට නො හැකි විය. අවසානයේ දී ඒ පරාජය කරනු ලැබුයේ මිනිසුන්ට ස්වාභාවිකව ම ඇති ඉන්ද්‍රිය පිනවීමට ඇති කැමැත්ත නිල අධ්‍යාපනය විසින් තහවුරු කිරීමත් සමග ය. නිල අධ්‍යාපනයට එලෙස තහවුරු කිරීමට හැකිවූයේ කෙසේ ද යන ප්‍රශ්නය දැන් පැන නැගෙයි.

ඒ බටහිර නිල අධ්‍යාපනයේ තිබූ ශක්තියක් නිසා ම සිදු වූවක් නො වෙයි. බටහිර නිල අධ්‍යාපනය මෙරට තහවුරු කෙරුණේ රැකියා අවස්ථා ඔස්සේ ය. කෝල්බෲක් සහ කැමරන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා මගින් සිදුවූයේ සිංහල සමාජ ක්‍රමය කඩා බිඳ දැමීම ය. ඒ සමග කුලී වැඩ සඳහා සමාජයීය තත්වයක් ලබාදීමට කටයුතු කෙරිණි. වැටුපට වැඩකිරීම යනු කුලී වැඩකිරීමකි. අමාත්‍යාංශ ලේකම්වරයා ද, විශ්වවිද්‍යාල මහාචාර්යවරයා ද, වෛද්‍යවරයා ද ඉංජිනේරුවාද කරන්නේ කුලී වැඩ ය. එහෙත් එයට කුලී වැඩ යැයි නොකීමට අපි ප්‍රවේසම් වෙමු. එනම් යටත්විජිත සමාජය විසින් ඒ කුලී වැඩ නොවේ ය යන ආකල්පය අපට දී ඇත.

© Prof. Nalin De Silva

වැඩි වැටුපක් ලැබෙන ඊනියා උසස් රැකියාවක නිරතවීමට හැකි වූයේ බටහිර උසස් අධ්‍යාපනය ලබාගැනීමෙනි. බටහිර අධ්‍යාපනයට එලෙස වැදගත් කමක් ලැබිණි. එමෙන් ම බටහිර දැනුමට ද ඒ සමග සමජයීය තත්වයක් ලබා දීමට කටයුතු කෙරිණි. එහි දී ඊනියා විද්‍යාත්මක ක්‍රමය බටහිර විද්‍යාවේ යොදා ගැනෙන බව ද බටහිර දැනුමෙන් ඊනියා යථාර්ථය දැනගැනීමට හැකි බව ද අනෙක් දැනුම් මිථ්‍යාවන් බව ද ප්‍රචාරය කෙරිණි. මේ සියල්ල එකිනෙකට බැඳී ඇති බව පැහැදිලි විය යුතු ය. එහි ප්‍රතිඵලය වූයේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට සිංහල බෞද්ධ චින්තනය අවසානයෙහි දී, එනම් දැනට අවුරුදු පනහකට මෙපිට පරාජය කිරීමට හැකි වීම ය. සියලු උප්පරවැට්ටි උපක්‍රම පමණක් නොව ආධිපත්‍යය ද යොදා සිංහල බෞද්ධ චින්තනය පැරදවීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවුරුදු හාරසිය පනහක පමණ කාලයක් ගතවීමෙන් පෙන්නුම් කරන්නේ සිංහල බෞද්ධ චින්තනයෙහි යම් ශක්තියකි.

අද සිංහල බෞද්ධ චින්තනයක් මෙරට ප්‍රායෝගිකව නැත. අල්පේච්ඡ සල්ලහුක ජීවිත ගතකරන්නෝ සුළු පිරිසකට පමණක් සීමා වෙති. අප දැන් කළ යුත්තේ කුමක් ද? පළමුවෙන් ම මෙරට ජනවර්ග ලවා සිංහල බෞද්ධ සංස්කෘතිය ලංකාවේ විශේෂිත සංස්කෘතිය බව පිළිගැන්වීමට කටයුතු කළ යුතු ය. එමෙන් ම සිංහල බෞද්ධ චින්තනයෙහි පදනම් ව අද වහා වහා දැනුම නිර්මාණය කළ යුතු ය. අඩුම තරමින් ඇතැම් කරුණුවලදීවත් බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් ලබාගත නොහැකි දේ සිංහල බෞද්ධ චින්තනයෙන් ලබාගත හැකි බව පෙන්වා දිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva